හා බටහිර දෙසට එසවුණු දකුණත සහිත කිසියම් කෙනෙකුගේ ප්‍රතිමාවක්, සහ අවසාන වශයෙන්ම ආදම් සියතින්ම තනන ලද සොහොන් ගෙයක හැඩහුරුකමින් යුතු දිගටි චතුරශ්‍රාකාර නිවසද වේ. එහි බිත්තියේ මැදින් තැනූ දොරකි. බිත්ති එක පිට එක තැබූ කිරි ගරුඬ තට්ටු වලින් නිමවා ඇත. මහා ජලකඳ කන්ද මුදුනට ළඟා නොවුයෙන් ගොඩනැගිල්ලට කිසිදු හානියක් වී නැත.

කුරානයේ දෙවන පරිච්ඡේදයේ මෙසේ සඳහන් වේ. සාතන් ඔවුන්ට (ආදම් සහ ඒවට) දඬුවම් වශයෙන් පාරාදීසය අහිමි කොට සන්තෝෂයෙන්ද පහ කරන ලදී. ඒ මොහොතේ අපි මෙසේ කීවෙමු. අපි නුඹලා පෘථිවියට කැඳවා ගන්නෙමු. දැන් නුඹලා එකිනෙකාගේ සතුරන්ය. පෘථිවිය නුඹලාට වාසස්ථානයක් වනු ඇත. එහි ඍතුමය වෙනස්කම්ද ඇතිවනු ඇත. කුරානයේ එන මෙම විස්තරය සාලේ මෙසේ පැහැදිලි කරයි.

ඔවුන් පාරාදීසයෙන් පිටුවහල් කරනු ලැබූ මොහොතේ ආදම් සෙරන්ඩිබ් නැතහොත් ලංකා දිවයිනට ඇද වැටුණි. ඒව අරාබියේ ජෙඩා මතට පහත් වුණි. අවුරුදු දෙසීයක් වෙන්ව විසීමෙන් පසුව මක්කම අසල කඳුකරයක ගාබ්‍රියෙල් දේව දූතිය විසින් ආදම් කැඳවා ඔහුගේ පාපොච්චාරණයට සවන් දෙමින් සිටි අතරවාරයේ ආදම්ට සිය බිරිඳ නැවත මුණ ගැසුනෙන් ආදම් ඇය සමග ලංකාවට පැමිණියේය. එහිදී ආදම් ට නීති උල්ලංඝනය කිරීමෙන් තමා කල වරදට දඬුවම් වශයෙන් අවුරුදු ගණනාවක් තනි පයින් සිටගෙන සිටීමට සිදු විය. දුකට පත් ඔහුගේ ආත්මය විසින් දඬුවමේ සත්‍යතාවය ඔප්පු කරනු වස් පා සළකුණ ඉතිරි කළ බව පැවසේ. සර් තෝමස් හර්බට් අපට කියන්නේ මීට නොපරදින කතාවකි. සයික්ලඩ්ස් හි කන්‍යාවියන්ගේ කඳුළු, මුතු වලට හැරුණාක් මෙන් ආදම්ගේ කඳුළු ද මැණික් බවට හැරුණි. ආබෙල් ගේ මරණය කණ වැකුණු විට අපේ පළමුවන මුතුන් මිත්තාගේ දැසින් ගැලූ කඳුලින් කන්ද මුදුනේ වැවක් සෑදුණි. (එවැනි වැවක් නැත).

මෙම කතාවට තවත් යමක් එකතු කරන මුස්ලිම් ලේඛකයෙක්, යුප්‍රිටස් ගංගාව සැදුණේ දකුණු ඇසින් ගැලූ කඳුලින් බවත්, වම් ඇසේ කඳුළු ටයිග්‍රිස් ගංගාව බිහි වීමට මුල් වූ බවත් කියයි. මෙම කතා යුදෙව් මූලාශ්‍ර වලින් ඇතිවූ ඒවා විය හැකිය. මෙහිදී සිය හයවන චාරිකාවේදී සෙරන්ඩිබ් හි අග නුවරට ගිය බව කියන සින්බෑඩ් ගේ මනහර කතා පුවත අමතක වෙන්නේ කාටද? එහි ඔහු මෙවැනි විස්තරයක් ගෙන එයි. මුහුදේ සිට දින තුනක ගමනකින් පසු රට මැද උස් කඳු වළල්ලකින් වට වූ දර්ශනීය මිටියාවතක කෙළවරේ එය පිහිටියේය. පාරාදීසයෙන් පහ කළ ආදම් ට පූජෝපහාර දැක්වීම සඳහා වන්දනා ගමනක යෙදුණෙමි. ඔහු කොටුවී සිටින කඳු මුදුනට නැගීමට මා තුල ඇති වූයේ බලවත් කුතුහලයකි.

(**කතුවරයාගේ පසු සටහන** -- සින්බෑඩ් පිළිබඳව සඳහන් කරන අතර ඔහු විසින් කියන ලද කාන්දම් කන්දේ කතා පුවත මට සිහියට නැගුණි. කාන්දම් කන්ද පසු කර යන නැව් වල යකඩ ඇණ ගැලවී එදෙසට ඇදී යන බවට ඔහු කී කතාව තවත් අරාබි ලේඛකයින් ගණනාවක් විසින් තහවුරු කර තිබුණි. වර්තමාන සිංහලයින් බෝට්ටු තැනීමේදී යකඩ ඇණ වෙනුවට ලී ඇණ යොදා ගන්නේ පල්ලඩීස් ගේ කොන්දේසියක් වන ලංකාවට යන නැව් යකඩ ඇණ නොව ලී ඇණ යොදා තැනිය යුතුය යන්න හා මනාව ගැලපෙන පරිදිය.

(පරිවර්තකගේ සටහන -- පර්යේෂණ සටහන්වලට අනුව පල්ලඩීස් යනු හතර වන සියවසේ ජීවත් වු රෝමන් ගත්කතුවරයෙකි. කෘෂි විද්‍යාඥයෙකුද වූ ඔහුට ඉතාලියේ හා සාඩිනියාවේ වතු ගණනාවක් තිබී ඇත.)

**ශ්‍රී පාද කන්ද පිළිබඳ ඉතිහාස කතා**
**තවදුරටත් ලබන කලාපයේ.**


# ALG & ASSOCIATES

**FOR ALL YOUR TAXATION, ACCOUNTING & BOOKKEEPING NEEDS**

- Individual & Business Income Tax Returns (Partnership, Trust & Company)
- Self Managed Superannuation Funds
- Accounting & Bookkeeping
- Business Activity Statements (GST Returns) & Instalment Activity Statements
- Company Secretarial
- Business Consultants
- Tax Planning

**Arjuna Gunawardena CPA B.Ec**
Registered Tax agent

ABN 63 865 123 157
PO Box 1335 Glen Waverly 3150
Tel - (03) 9802 3322
Fax - (03) 9802 6654
Mobile - 0438 194 827
Email - aplus_ms@bigpond.net.au

Have Peace of Mind....talk to us
ඔබේ සිතට සැනසුම ලබාගන්න . . . අදම අප අමතන්න



ඔබේ මූල්‍ය අවශ්‍යතාවයන්ට
අපෙන් නොමිලේ උපදෙස් හා සේවා රැසක්

Aplus Mortgage Solutions

We will help you to solve your financial needs.

We deal with reputed banks and other financial institutions.
We are confident of giving the fitting product to meet your needs.

**We can help you with**
Home Loans
Business Loans
Construction Loans
Lines of Credit
Debt Consolidation
Investment Loans
Low Doc and No Doc Loans
Commercial Loans
Zero Deposit Loans



We can also help you with a FREE Mortgage Health Check to see whether your present arrangements are adequate

MIAA

Call our mortgage consultant
Arjuna Gunawardena CPA B.Ec
on (03) 9802 3322 0438 194 827
or e mail us aplus_ms@bigpond.net.au

Ace Financial Solutions Pty Ltd trading as Aplus Mortgage Solutions
ABN 49 111 011 182 P O Box 1335 Glen Waverley Victoria 3150
Telephone +61 3 9802 3322 Facsimile +61 3 9802 6654 Email aplus_ms@bigpond.net.au